*සැ. යු.*-2014.11.21 දින පළ වූ අංක 1,890 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,891 - 2014 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2014.11.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 2078 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2088 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2075- B 80896—2,875 (2014/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## ජාතික සමාජ සංවර්ධන ආයතනය
(සමාජ සේවා අමාත්‍යාංශය)

01. *තනතුර* : **අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල් (අධ්‍යයන කටයුතු) තනතුර - 01**

02. *වයස් සීමාව* : අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

03. *අධ්‍යාපන සුදුසුකම්* : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජයීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධියක් සමඟ සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

04. *පළපුරුද්ද* : රජයේ හෝ රාජ්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමණාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම. (මෙම සේවා කාලයෙන් අවම වශයෙන් වසර 03ක් සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගැනීමෙන් පසුව විය යුතුය.)

05. *අතිරේක වෘත්තිය සුදුසුකම්* : සමාජ සේවා/සමාජ සුභ සාධන/සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ වැඩසටහන් කළමණාකරණය කිරීම හා සමාජ වැඩ වෘත්තීය ආයතනයක (Professional Body ) සාමාජිකත්වය දැරීම.

06. *වැටුප් ක්‍රමය* : HM2-1-රු. 44,030-12 x 1,310 - රු. 59,750 (මාසිකව)

02. *තනතුර* : **මහාචාර්ය තනතුරු - 01**

02. *වයස් සීමාව* : අවුරුදු 55ට අඩුවිය යුතුය.

03. *බඳවා ගැනීමේ සුදුසුකම්* : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සමාජ වැඩ/සමාජයීය විද්‍යාවන් පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත උපාධියක් ;

*හෝ*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ පිළිබඳ හෝ සමාජයීය විද්‍යාවන්ගෙන් ලබාගත් පංති සාමාර්ථයක් රහිත උපාධිය සමඟ සමාජ වැඩ, සමාජ සුභසාධනය, සමාජ ප්‍රතිපත්ති, උපදේශනය, සමාජ/ප්‍රජා සංවර්ධනය යන විෂයන්ගෙන් හෝ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් අවම වශයෙන් එක් අවුරුදු කාලසීමාවකට නොඅඩු ශාස්ත්‍රපති උපාධියක්;

*සහ*

: විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ පිළිබඳ හෝ සමාජයීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් සම්පූර්ණ කිරීම (සමාජ වැඩ ආචාර්ය උපාධිය සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.)

*සහ*

: අදාළ ආචාර්ය උපාධිය ලැබීමෙන් පසු විශ්ව විද්‍යාල මට්ටමේ ඉගැන්වීම් හා පර්යේෂණ කාර්යයන්හි අවම වශයෙන් වරස 10ක අත්දැකීම් සමඟ අධ්‍යාපන පරිපාලනයෙහි ප්‍රමාණවත් ඇත්දැකීම්

*හෝ*

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ වසර 10 ක සේවා පළපුරුද්දක් සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ හෝ සාමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම;

*සහ*

ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමට හැකියාවක් තිබිය යුතුය.

04. *වැටුප් ක්‍රමය* : HM2-3-2006 රු. 47,245-12x1,310 - රු. 62,965 (මාසිකව)

03. තනතුර : **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුරු 01**

02. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

03. *අධ්‍යාපන සුදුසුකම්* : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සාමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධියක් සමඟ සමාජ වැඩ (Social Work) පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

04. *පළපුරුද්ද* : රජයේ හෝ රජය පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක වසර 10 කට නොඅඩු සමාජ වැඩ අධ්‍යයන හා ඉගැන්වීම් අංශයන්හි පළපුරුද්දක් තිබීම.

05. *වැටුප් ක්‍රමය* : AR-2-2006ඒ- රු. 34,550-10x925- රු. 43,880 (මාසිකව)

04. *තනතුර* : **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි - තනතුරු 01**

02. *වයස් සීමාව* : අයදුම්පත්භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

03. *අධ්‍යාපන සුදුසුකම්* : (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමඟ සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් ලබා තිබීම;

*හා*

රජයේ හෝ රජය පිළිගත් අධ්‍යාපන ආයතනයක වසර 10කට නොඅඩු සමාජ වැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්ද තිබීම;

*හෝ*

04. *පළපුරුද්ද* (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමඟ සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*හා*

රජයේ හෝ රජය පිළිගත් අධ්‍යාපන ආයතනයක වසර 15කට නොඅඩු සමාජ වැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම.

05. *වැටුප් පරිමාණය* : AR-2-2006A - රු. 34,550 -10 x 925 - රු. 43,880 (මාසිකව)

05. *තනතුර* : ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික III - තනතුරු 01

02. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.)

03. *අධ්‍යාපන සුදුසුකම්* : (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම;

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂයය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධක මට්ටම ලබා තිබීම;

(ඇ) *තාක්ෂණික නිපුනතා/ප්‍රවීණතා* එක් එක් තනතුරෙහි කාර්ය-භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

04. *වැටුප් පරිමාණය* : MA-2-2-2006A - රු. 14,610-10x145-7x170-4x290-20x345-රු. 25,310 (මාසිකව)

06. *තනතුර* : **ශ්‍රව්‍ය දෘෂ්‍ය සහායක III - තනතුරු 01**

02. *වයස් සීමාව* : වයස අවුරුදු 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.)

03. *අධ්‍යාපන සුදුසුකම්* : (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) වත් සමත්වී තිබිය යුතුය;

(ආ) *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා* අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) දෙවන හෝ තුන්වන මට්ටමට සරිලන සේ අත්පත් කර ගෙන තිබිය යුතුය;

(ඇ) *වෘත්තීය දැනුම* ඉලෙක්ට්‍රෝනික හා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ක්‍රියාකරවීම් මූල-ධර්මයන් පිළිබඳ මනා දැනුමක් තිබීම හා ඒවා ක්‍රියා කරවීම,

ආරක්‍ෂාව හා නඩත්තුව පිළිබඳව පිළිගත් ආයතනයක වසර 05ක් සේවය කර පළපුරුද්දක් තිබීම.

සටහන

ඡායාරූප ශිල්පය පිළිබඳ කුසලතාවය විශේෂ සැළකිල්ලකට භාජනය කරනු ඇත.

04. වැටුප් පරිමාණය : PL-2-2-2006A- රු. 12,410-10x130-10x145-10x160-12-170-රු.18,800 (මාසිකව)

සියළුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි.

1. තනතුර ස්ථිරය.
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**සටහන :** මෙම තනතුරු පුරප්පාඩුව පවතින්නේ නාවල, රාජගිරියේ ප්‍රධාන කාර්යාලයේ වන අතර මෙම අයාතනයට කිසිදු ශාඛාවක් නොමැත. තෝරා ගන්නා අයදුම්කරුවන් පහත සඳහන් ලිපිනයේ ඇති ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කළ යුතුය.

*සේවා කොන්දේසි :*

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධි විධානවලට හා රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි වලට යටත් විය යුතුය.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2014.12.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ආචාර්ය රිඩ්ලි ජයසිංහ,
අධ්‍යක්‍ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2014 නොවැම්බර් මස 12 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488 ඒ, නාවල පාර, රාජගිරිය.

11-767

---

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

නිත්‍ය ගුවන්භට/ගුවන් කාන්තා

1. (අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

(1) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්

(අ) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි)
(ආ) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඇ) පරිගණක කාර්මික ශිල්පී (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පුහුණුව පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ අදාල ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) සැපයුම් වෘත්තීන් :-

(අ) සැපයුම් සහායක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක ( Microsoft Office Package) පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ආ) නිළ ඇඳුම් පරිස්කාරක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

අධිවේගී මහන මැෂින් (Over lock, Button Hole, Button attendant, Double needle, Bar tack) ක්‍රියා කරවීමේ හැකියාව ද, පතුරම් සහිතව මිම් අනුව මෝස්තර නිර්මාණ කිරීමේ හැකියාව. ඇඳුම් කැපීම සහ මහන මැෂින් පිළිබඳ කාර්මික දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(3) තූර්ය වාදක වෘත්තීන් :-

(අ) සංගීතඥ (පිරිමි) - (Millitary Band, Bag Pipe, Papara Band, Rock Band, Eastern Band, Calypso Band, Beat Group, Oriental Orchestra and Sound Operators)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. වාදනය හා ගායනය පිළිබඳ මනා දැනුමක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ආ) නර්ථන ශිල්පී (පිරිමි, කාන්තා) :-

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. නර්ථනය පිළිබඳ මනා හැකියාවක් තිබීම, නර්ථනයට සුදුසු ශාරීරික හැඩයක් තිබීම, ජන ගී ගායනය, නර්ථනයට අදාල තූර්ය වාදක භාණ්ඩ වාදනය සහ වේශ නිරූපනය පිළිබඳ ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

නිත්‍ය ගුවන් භට ඉඳුරාම බඳවා ගැනීම් :-

2. (අ) *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :-*

(1) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් :

(*අ*) ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පි (පිරිමි)
(*ආ*) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පි (පිරිමි)

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) පාඨමාලා සමත් සහතිකය තිබිය යුතුය.

(*ඇ*) පරිගණක කාර්මික ශිල්පි (පිරිමි) ෘ

පරිගණක පුහුණුව පිළිබඳ මාස 6ක පූර්ණ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. පහත සඳහන් විෂයයන් පිළිබඳව අදාල ක්ෂේත්‍රයේ වසර 2ක පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

-ජාලකරණය
-මෘදුකාංග නිර්මාණය
-දෘඩාංග/මෘදුකාංග නවීකරණය

පරිසණක පුහුණුව පිළිබඳ මාස 12ක අර්ධ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. පහත සඳහන් විෂයයන් පිළිබඳව අදාල ක්ෂේත්‍රයේ වසර 2ක පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ (පාඨමාලා කාලය 50%ක ප්‍රමාණයක් සලකා බලනු ලැබේ.)

-ජාලකරණය
-මෘදුකාංග නිර්මාණය
-දෘඩාංග/මෘදුකාංග නවීකරණය

ඉඳුරාම බඳවා ගැනීම් සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් මත නායක ගුවන්භට නිළයට බඳවා ගනු ලැබේ.

3. *අනෙකුත් සුදුසුකම්.—*ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි. :

*පුරවැසිභාවය* : ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි;

*සිවිල් තත්ත්වය*
*හා වයස* : නිත්‍ය ගුවන්භට 2015 ජනවාරි මස 20 දිනට අවුරුදු 18-23ත් අතර (අවිවාහක)
නිත්‍ය ගුවන් කාන්තා 2015 ජනවාරි මස 20 දිනට අවුරුදු 18-22 ත් අතර (අවිවාහක)

නිත්‍ය ගුවන් භට ඉඳුරාම බඳවා ගැනීම් 2015 ජනවාරි මස 20 දිනට අවුරුදු 18-28ත් අතර (විවාහක/අවිවාහක)

*උස* : අඩි 5යි අඟල් 5කට නොඅඩු (පිරිමි)
අඩි 5යි අඟල් 3කට නොඅඩු (කාන්තා)

*බර* : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$\text{BMI} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස}^2\text{ (මී)}}$$

*වර්ණ දෘෂ්ඨිය* : CP2

*දෘෂ්ඨි තීක්ෂණත්වය* : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (*උපැස් රහිත*)

*සැලකිය යුතුයි ෘ-*

ඉඳුරාම බඳවා ගන්නා ලද නිත්‍ය ගුවන් භටයින් සඳහා ගුවන් හමුදාවට බැඳී මූලික පුහුණු පාඨමාලාව අවසන් වී වසරක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

නිත්‍ය ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරුත්, මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

නර්ථන ශිල්පී වෘත්තියේ නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා ගුවන් හමුදාවට බැඳී වසර 05ක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

4. පළමුවන/දෙවන ඡේදයෙහි "අ" හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ තුන්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමිවලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

5. *සේවා කොන්දේසි* :

(*අ*) ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුණුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(*ආ*) තෝරාගනු ලබන සියලුම ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් මූලික සටන් පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. ඉන්පසුව වෘත්තීය පුහුණු පාඨමාලාව ලබා දෙන අතර (ඉඳුරාම බඳවා ගැනීම හැර) ඔවුන් ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුය.

6. *බඳවා ගැනීමේ කොන්දේසි* :

ඉඳුරාම බඳවා ගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම් මත නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ නායක ගුවන් භට නිළයට ඇතුළත් කරනු ලබන අතර අනෙකුත් බඳවා ගැනීම් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලැබේ. ඔවුන් සියලු දෙනා වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08 ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

7. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්.—*තෝරාගනු ලබන අපේක්ෂකයින් /අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

8. *වැටුප් හා දීමනා* :

(අ) වසරකට ගුවන් හටයින්ට අදාළ ඒකාබද්ද වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ :-

ගුවන්හට - රු. 1,73,100 - 6 x 1,740 - 19 x 2,040 = රු. 2,22,300 වාර්ෂිකව
නායක ගුවන්හට - රු. 1,78,320 - 4 x 1,740 - 19 x 2,040 = රු. 2,22,300 වාර්ෂිකව
කෝප්‍රල් - රු. 1,83,540 - 10 x 2,040 - 9 x 2,880 = රු. 2,29,860 වාර්ෂිකව
සැරයන් - රු. 187,620 - 3 x රු. 2,040 - 9 x රු. 2,880 - 3 x රු. 3,840 = රු. 2,31,180 වාර්ෂිකව
බලපත්ති සැරයන් - රු. 191,700 - 1 x රු. 2,040 x 9 x රු. 2,880 - 3 x රු. 3,840 = රු. 231,180 වාර්ෂිකව
බලලත් නිළධාරින් රු. 199,500 - 7 x 2,880 x 14 x 3,840 = රු. 273,420 වාර්ෂිකව
ප්‍රධාන බලලත් නිළධාරීන් රු. 2,23,500 - 13 x රු. 3,840 = රු. 2,73,420 වාර්ෂිකව

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. ගුවන් හටයින්ගේ/ගුවන් කාන්තාවන්ගේ සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්‍ෂමතාව මත ඉදිරි නිළයන් පිරිනමනු ලබන අතර, ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

(ආ) *දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800 ක් ගෙවනු ලැබේ.

(2) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.

(3) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්හට මසකට රු. 3,900 ක් ගෙවනු ලැබේ.

(4) විශේෂ දීමනාව I : මසකට රු. 2,400 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්)

(5) විශේෂ දීමනාව II : ඒකාබද්ධ වැටුපෙන් 15% සහ රු. 750.00 ගෙවනු ලැබේ.

(6) *දිරි දීමනා.*—සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු. 850 දක්වා).

(7) *ආහාර දීමනා.*—පිටත වාසය කරන ගුවන් හටයින්ට මසකට රු. 13,197.00 බැගින් ගෙවනු ලැබේ. (කඳවුරු තුළ වාසය කරන ගුවන්හටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.)

(8) *නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.*—මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.

(9) අන්තර් දීමනාව : මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.

(10) *නේවාසික පහසුකම්.*— කඳවුර තුළ වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(11) *ගමනාගමනය.*—වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් හටයා/භාර්යාව සහ ළමයින්ට අදාළ පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(12) *වික්ෂේපණ දීමනා.*—මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(13) *සුදුසුකම් වැටුප්.*—ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(14) *යහපත් කල්ක්‍රියා ලාංජන දීමනා.*—මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ට ය. (මසකට රු. 30 සිට රු. 511.50 දක්වා)

(15) *නැවත සේවයට බැඳීමේ වැටුප්.*—නැවත සේවයට බැඳෙන ගුවන් හටයන්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(16) *වෛද්‍ය පහසුකම්.*—ගුවන් හමුදාව මගින් සෑම ගුවන් හටයකුටම/ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර, විවාහක නම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(17) කඳවුරුවල සිට සැතපුම් 30ක (කි. මී. 48ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් හටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(18) රජයේ නිවාසයට වාසය නොකරන විවාහක ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවකටම මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(19) *උපදේශක දීමනාව.*—මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමිවේ.

(20) *වෙනත් දීමනා.*—(වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(21) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් හටයින්/ගුවන් කාන්තාවක්ම දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

09. *ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස්* :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වුවන් ස්වකීය ඉල්ලුම්පත්, ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/

මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. තව ද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමඟ තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික,

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය,

(5) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

10. පිරිමි අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ 2014 දෙසැම්බර් මස 05, 08 සහ 09 යන දිනවල ද, කාන්තා අයදුම්කාරියන් සඳහා සම්මුඛ පරීක්ෂණ 2014 දෙසැම්බර් මස 10 සහ 11 යන දිනවල ද පෙ. ව. 9.00 පැයේ සිට ප. ව. 1.00 පැය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෘත්තීය පුහුණු පාසැල ඒකල කඳවුරේ දී පැවැත්වේ.

11. නියම කරනු ලබන ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ අපේක්ෂකත්වය පිළිබඳ සලකා බලනු නොලැබේ.

12. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ.

13. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුව ද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් /අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

14. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර, වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

15. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට/ඇයට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගුවීමට හේතු වන්නේ ය.

16. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී. එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

17. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

(කේ. ඒ. ගුණතිලක)
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594
කොළඹ.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත**

1. සම්පූර්ණ නම :————.
(ජාතික හැඳුනුම්පතට අනුව)

2. ජාතික හැඳුනුම්පත් අංකය :————.

3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :————.

4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :————.

5. ස්ථිර ලිපිනය :————.

6. ආසන්නතම ගුවන් හමුදා කඳවුර :————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

8. දිස්ත්‍රික්කය:————.

9. මැතිවරණ කොට්ඨාසය :————.

10. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

11. දුරකථන අංකය :————.

12. උපන් දිනය :————.

13. වයස (2015 ජනවාරි මස 10 වන දිනට) ඃ

අවුරුදු :————. මාස :————. දින :————.

14. විවාහක/අවිවාහක බව :————.

15. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

16. උස ඃ අඩි :————. අඟල් :————.

17. අ. පො. ස. (සා/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

18. අ. පො. ස. (උ/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

19. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පලපුරුද්ද ආදිය) :————.

20. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවලදී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.

22. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්තම් ඒ පිළිබඳ විස්තර :————.

23. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇප බැඳ හෝ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

24. *චරිත සහතික පිළිබඳ විස්තර :*

| *නම* | *පදවි නාමය* | *ලිපිනය* |
|---|---|---|
| | | |

25. *ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය :————.

11-848

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 නොවැම්බර් මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | තිහගොඩ | තිහගොඩ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා ගඟබඩපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

11-870

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍ය වේ.

කාතිවරයාට මසකට රුපියල් 6,000ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2014 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමඟ ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ඩබ්ලියු. කේ. ඩී. විජේරත්න,<br>
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට.

2014 නොවැම්බර් මස 10 වැනි දින.<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,<br>
තැ. පෙ. 573,<br>
කොළඹ 12.

### උපලේඛනය

1. **ගාල්ල** - ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **කොළඹ බටහිර** - කොළඹ අධිකරණ කලාපයේ දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල සහ අතුරුගිරිය යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

### 1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය යටතේ) ......... ප්‍රදේශය සඳහා ක්වාසිවරයෙකු පත් කිරීමේ ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

2. මුලකුරු සමග නම :

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකථන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

12. වෘත්තීය සුදුසුකම් :

13. ඉල්ලුම්කරුට කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉල්ලුම්කරුට මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? :

15. විවාහක ද ? :

16. භාර්යාව ජීවත්ව සිටී ද? :

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමඟ) :

| සිට | දක්වා | රැකියාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

18. ඉල්ලුම්කරු සතු දේපළ වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද :

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද :

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? :

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිව යුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| (1)<br>නම : | (2)<br>නම : |
| ලිපිනය : | ලිපිනය : |
| රක්ෂාව : | රක්ෂාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මාවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

සටහන : සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

11-919

**රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය**

ලේකම් හා ගණකාධිකාරී තනතුර

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ "ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගෙන් (ස්ත්‍රී/පුරුෂ) අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ හෝ I පන්තියේ නිලධාරියෙකු විය යුතුය.
(ii) කොළඹට සැතපුම් 30ක් ඇතුළත ස්ථිරව පදිංචිව සිටිය යුතුය.
(iii) 2015.01.01 දිනට වයස අවුරුදු 57ට අඩු විය යුතුය.
(iv) රාජ්‍ය සේවයේ අවුරුදු 15කට නොඅඩු සේවාවක් තිබිය යුතුය.
(v) ඉල්ලුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් වැඩකිරීමේ හැකියාව තිබිය යුතුය.
(vi) ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳවත්, පරිගණක දැනුම හා පළපුරුද්ද ඇති සංගමයේ සාමාජිකත්වය දරන අය කෙරෙහි හා දෙමළ භාෂාව ගැන දැනුමක් ඇති අය කෙරෙහිත් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*තනතුරට අදාල වැටුප.*—තෝරාගත් අයදුම්කරුට රාජ්‍ය සේවයේදී ලැබූ වැටුප හා දීමනාද ඊට අමතරව ඒකාබද්ධ වැටුපෙන් 50%ක අතිරේක දීමනාවක්ද ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු 02ක (දෙකක) කාලයක් සංගමයේ සේවය සඳහා ද්විතියනය පදනම මත බඳවාගනු ලැබේ. ඔහු විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඇප ඔප්පුවක් මඟින් රු. 10,000 ක රක්ෂණ ඇපයක් තැබිය යුතුය.

සියළු විස්තර සහිත අයදුම්පත් තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2014.12.31 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩබ්. එල්. ටී. සුමතිරත්න,
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය.

2014 නොවැම්බර් මස 21 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

11-881

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ජනපද නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත 02 හි සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගය 2014 දෙසැම්බර් මාසයේ දී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් කොළඹ දී පවත්වනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමවේදය :-
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ට නොවැඩි සංඛ්‍යාවක් වූ පුරප්පාඩු පහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කළ තැනැත්තන් ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පුරවනු ලැබේ.

02. සුදුසුකම් :-

(i) *අධ්‍යාපන සුදුසුකම්.*—සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව/ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත් වීම; සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

(ii) *වෘත්තීය සුදුසුකම්.*—තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම.

03. වැටුප් පරිමාණය සහ කාණ්ඩය :

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය :

රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885

වැටුප් කේත අංකය -MN -3-2006A

04. වයස් සීමාව :- ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුය.

05. කායික යෝග්‍යතාව හා අනෙකුත් සේවා කොන්දේසි :-

(අ) සෑම අයදුම්කරුවෙකුම යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
(ඇ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව නියම කරනු ලබන භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(ඈ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වන අතර, අවුරුදු තුනක, පරිවාස කාලයකට යටත් වේ.

06. විභාග ක්‍රමය :-

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.
(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන්ය.

සටහන :

(i) ඉහත "සුදුසුකම් ලත් විභාගය" යන පදයෙන් අදහස් කරන්නේ 02 වැනි ඡේදයේ දක්වා ඇති විභාගවලින් එකක්ය.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු එවිය යුතුය.

(iii) තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයන්ට ඉඩදෙනු නොලැබේ.

07. ලිඛිත පරීක්ෂණයේ දී විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර වලින් යුක්තය. |
| 2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය හා එහි විකාශය, ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය හා ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ ව්‍යුහගත ශෛලියේ ප්‍රශ්න පත්‍රයකි. පහත විෂයයන් පිළිබඳ සරල අවබෝධයක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වේ.<br><br>I. ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය සහ එහි විකාශය<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ ඉතිහාසය<br>- ලේඛන ලියාපදිංචි කිරීම මගින් ඉඩම් අයිතිය තහවුරු කිරීම<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම ලියාපදිංචි කිරීම<br><br>II. ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර<br>- බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් හඳුන්වාදුන් මුඩුබිම් ආඥා පනත සහ එමගින් ඇති වූ සමාජ වෙනස්කම්<br>- 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත ආරම්භ වීම සහ ගොවි ජනතාවට ඉඩම්වල අයිතිය ලබා දීම<br>- 1972 දී හඳුන්වාදුන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත සහ එමගින් ඇති වූ ඉඩම් ප්‍රතිසංස්කරණය<br><br>III. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය<br>- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති<br>- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝග නිෂ්පාදනය සහ ආහාර සුරක්ෂිතභාවය<br>- ඉඩම් සංවර්ධනය සහ ආරක්ෂා කර ගැනීම<br>- ශ්‍රී ලංකාව තුළ ජාතික නිෂ්පාදනයේදී කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>- බෝග විවිධාංගීකරණය<br>- ජල පාලනය<br>- පාංශු සංරක්ෂණය<br><br>IV. ජනාවාස සැලසුම්කරණය සහ කළමනාකරණය<br>- ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ මූලික අංග<br>- සමාජ ආර්ථික සමීක්ෂණ<br>- නැවත පදිංචි කිරීම<br>- ප්‍රජා සංවර්ධනය<br>- මූලික යටිතල පහසුකම් සංවර්ධනය |

08. සම්මුඛ පරීක්ෂණය :-

ලිඛිත පරීක්ෂණයේ දී 40% ට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදු නොවන අතර අයදුම්කරුවන්ගේ සහතික පත්‍ර හා භෞතික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

09. විභාග කොන්දේසි :-

(i) විභාග ගාස්තු :

මේ සඳහා විභාග ගාස්තුව රු. 500 ක් වන අතර, විභාග ගාස්තු ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-99-00 ට බැර වන ලෙසට ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවිය

යුතුය. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉල්ලුම්කරු නමින් ලබාගත් කුවිතාන්සිය තම ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම :

(අ) මෙම නිවේදනයට යා කොට ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් 19 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, 1200/6, මිහිකත මැදුර, ඉඩම් මහලේකම් කාර්යාලය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ජනපද නිලධාරී විවෘත බඳවා ගැනීම - 2014" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතු ය.

(ඉ) අත්සන සහතික කිරීමට බලයලත් තැනැත්තෙකු විසින් අයදුම්පත්‍රයේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙක් ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රාජ්‍ය හෝ අධ්‍යක්ෂ පාලිත පාසැලක ප්‍රධානියෙකු රු. 240,360 ක් හෝ එයට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජ්‍ය කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු යන අය අතරින් කවරකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

10. විභාගයට ඇතුළත් කර ගැනීම

(අ) නියමිත පරිදි ඉල්ලුම් පත්‍ර එවන ලද අයදුම්කරුවන් වෙත ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2, 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහි දී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ එම විස්තර සමග ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම ද සුදුසු වේ. එසේ විමසීමේ දී අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත්, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් වෙතොත් ඔහුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) සාමාන්‍ය ගැසට් පත්‍රයේ I කොටසේ (II අ) ඡේදයෙහි පළ කර ඇති විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ඇ) විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ඈ) විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් ලියවිලි පමණකි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ඉ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

(ඊ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ලබාදෙනු ලබන උපදෙස්වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම උපදෙස් උල්ලංඝනය කළහොත් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

11. රාජ්‍ය සේවා කොමිසන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාවට හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

12. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැති නම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කරනු ලැබේ.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් හෝ නොගැළපීමක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු වේ.

ආර්. පී. ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

2014 නොවැම්බර් මස 28 වැනි දින,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.
1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

(කාර්යාලීය ප්‍රායෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ජනපද නිලධාරින් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for Recruitment of Colonization Officers Grade III of the Sri Lanka Technological Service - 2014

ගැසට් නිවේදනයේ 06 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :
1.1 මුල'කුරු සමග නම මුල'කුරු අගට යොදා (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : GUNAWARDHANA, M. G. B. S. K.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.1 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය එවනු ලබන්නේ මෙම ලිපිනයටයි)

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1 පුරුෂ -0)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජනවර්ගය :

(සිංහල - 1, දෙමළ -2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. 6.1 විවාහක/අවිවාහක බව : (විවාහක - 2, අවිවාහක -1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.2 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

6.3 2014 දෙසැම්බර් මස 19 වැනි දිනට වයස :

අවුරුදු : මාස : දින :

07. ගැසට් නිවේදනයේ 02. I හා II අනුව මෙම විභාගයට පෙනී සිටීම සඳහා හිමිකම් ලැබීමට ඔබ ලබා ඇති සුදුසුකම් සඳහන් කරන්න.

(i) අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා/පෙළ) විභාගය විභාග අංකය :————.
වර්ෂය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |

අ.පො.ස. (උ./පෙළ) විභාගය විභාග අංකය :————.
වර්ෂය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |

(ii) වෘත්තීය සුදුසුකම් :————.

08. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ අයදුම්පත්‍රයට අලවන්න.

(i) අංකය :————. (ii) මුදල් ගෙවූ ස්ථානය :————.

(iii) දිනය :————. (iv) ගෙවන ලද මුදල (රුපියල්) :————.

(මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් තබා ගැනීම පසු විපරම් කිරීමක දී වැදගත් වේ.)

09. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, මෙම විභාගය වෙනුවෙන් ගාස්තුව ගෙවන ලද අංක ......... හා .......... දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද, ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන විභාග නීතිරීති අනුව ක්‍රියා කිරීමට එකඟ වෙමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම යටත් වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. *අත්සන සහතික කිරීම* :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .................. නමැති අයදුම්කරු මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත්, සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන සහ මුද්‍රාව.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය (රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.) :————.

11. *අයදුම්කරු රජයේ සේවයේ නියුතු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන... .................. මහතා/මහත්මිය/ මෙනෙවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික නිලධාරියෙක් බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත්, සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

11-888

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2014.12.26 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2014.12.26 වේ. සියලුම අයදුම්පත් එදිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කිසිම අයැදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතු ය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන් තම අයැදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම්පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත්, ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුවද, යෝජිත නගර සියල්ලෙන්ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කොට නොමැති නම්, විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

### I වැනි උපලේඛනය

*විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

01. *අයැදුම්පත් කැඳවනු ලබන තනතුර* :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු III - ශ්‍රේණිය

02. *තනතුරේ රාජකාරි ස්වභාවය* :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය ධාවනය කිරීමේ කාර්යයේදී දුම්රිය එන්ජින් රියදුරුගේ කාර්යය සඳහා විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි වෘත්තීය කුසලතා මට්ටම් හය (06) යටතට ගැනෙන්නාවූ අදාළ තාක්ෂණික නිපුණතාවයෙන් සමන්විතව දුම්රිය එන්ජිම ක්‍රියාකරවීමේ කාර්ය ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් ඉටු කරන සේවා ගණයකි.

03. *වැටුප් පරිමාණය* :

දුම්රිය එන්ජින් රියදුරු - III පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය (MN- 3-2006- A) රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 වේ.

04. (අ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත් වී තිබීම;

*සහ*

(ii) අ. පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා විෂයයක් ඇතුළුව සියලු විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.).

(ආ) *වෘත්තීය සුදුසුකම් :*

පහත සඳහන් පාඨමාලාවලින් එකක් හෝ රත්මලාන ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනය හෝ රජයේ කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය යටතේ ඇති කාර්මික විද්‍යාලයක හෝ දෑවුරුදු පූර්ණකාලීන ඩීසල් එන්ජින් පිළිබඳ පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. මෙම පාඨමාලාව ජාතික වෘත්තීය කුසලතා හය (06) මට්ටම විය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව.

(ඇ) *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය;
(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය;
(iii) උස අවම වශයෙන් අඩි 05 අඟල් 04 ක් විය යුතු අතර, ප්‍රාශ්වාසයේ දී පපුව අඟල් 32ට නොඅඩු විය යුතු ය;
(iv) 6'/6', 6'/ 6' අක්ෂි දෘෂ්ඨි පරීක්‍ෂණයකින් සමත් විය යුතු ය.

(ඈ) *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය;

(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

*සටහන.*—මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ඉහත (04) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවැති පුරප්පාඩු පමණක් පුරවන අතර පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

06. *බඳවා ගැනීමේ පරීක්‍ෂණයේ විභාග පරිපාටිය* :-

(i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

(ii) *විභාග ක්‍රමය :*

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත් වේ.
(ආ) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(iii) *විභාගයේ විෂයයන් :*
(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය
(ආ) තාක්‍ෂණ දැනුම

(iv) *විෂය නිර්දේශය* :

(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය
කාලය පැය 1 යි, ලකුණු 100 යි.

අපේක්‍ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. "මෙය ගණිත ගැටළු සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න 50ක් ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය."

(ආ) *තාක්‍ෂණ දැනුම* - කාලය පැය 03 යි. ලකුණු 100 යි.

ඩීසල් එන්ජින් තාක්‍ෂණය හා ඒ ආශ්‍රිත දැනුම මෙන්ම යන්ත්‍රෝපකරණ පිළිබඳ දැනුම පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොටගෙන මෙය සම්පාදනයකරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(v) *තේරීම් පරිපාටිය* :

එක් එක් විෂයයකින් ලකුණු 40%ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන

අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්‍ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු දීමක් සිදු කරනු නොලැබේ. අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු - III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්‍ෂකයින් තෝරා ගනු ලබන්නේ ඉහත 06හි IV යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙලට අනුව ය.

*විභාග ප්‍රතිඵල :*

*ගැසට් නිවේදනයේ* 06 (v) ඡේදය අනුව ඉහළම ලකුණු ලැබූ අපේක්‍ෂයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකවද ප්‍රතිඵල දන්වා යවනු ඇත.

07. *අයැදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :*

(i) අයදුම්පත A 4 (යතුරුලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය.

(අයැදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි.)

*අයැදුම්පතේ—*

1 වැනි පිටුවේ 01 සිට 06 තෙක් කරුණු ද,

2 වැනි පිටුවේ 07 සිට 10 තෙක් කරුණු ද,

03 වැනි පිටුවේ අංක 11 හා 12 කරුණු ද,

04 වැනි පිටුවේ අංක 13 කරුණද වන පරිදි ඇතුළත් විය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

(iii) මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙන යම් ආකාරයට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තවද විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ “ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු - III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - 2014” යන්න සහ ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය සඳහන් කරන්න.

(v) *බාහිර අයැදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම :* රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, රා. ප. ච. 6/2006 අනුව රු. 19,755 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් හෝ ලබන රජයේ නිලධාරියකු විසින් සිදු කළ යුතු ය.

(vi) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vii) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්‍ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(viii) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම් පත්‍රයෙහි පිටපතද, ගෙවන ලද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, අයැදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකයද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයැදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සමඟ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(ix) "විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පළමුවෙන්ම පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත."

(x) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අපේක්‍ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි

කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

(xi) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(xii) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

08. *සේවා කොන්දේසි :*

බඳවා ගනු ලබන්නේ III වන ශ්‍රේණිය සඳහා ය.

09. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) විවෘත ක්‍රමය යටතේ බඳවා ගන්නා සෑම තැනැත්තෙකුම වසර දෙකක (02) ආධුනික කාලයකට (මෙම ආධුනික කාලය උපරිම වශයෙන් වසර 03ක සංශෝධනයකට යටත් විය හැක) යටත් ය. එම කාලය තුල දුම්රිය එන්ජින් රියදුරු තනතුරට අදාලව රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම, ප්‍රායෝගික පුහුණුව හා කුසලතාවයන් වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසනු ඇත. පුහුණු කාලය තුලදී එම ආධුනිකයන් අනුයුක්ත කරනු ලබන අංශයේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන්නේය. බඳවා ගැනීමේ පරිපාටියේ 7.2 උප වගන්තියේ දැක්වෙන ක්‍රමය තුලින් සේවයට පිවිසෙන ආධුනික නිලධාරියෙකු ආධුනික පුහුණුව අවසානයේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් නොවුනහොත් එම ආධුනික නිලධාරියාගේ සේවය අවසන් කරනු ඇත.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතුය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

වී. අමරතුංග,<br>දුම්රිය සාමාන්‍යාධිකාරී.

(මේ අනුව A - 4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for Recruitment for the post of Engine Driver Grade - III, Sri Lanka Railway Department - 2014

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරවැසිභාවය
පරම්පරාවෙන් -1
ලියාපදිංචි වීමෙන් -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) [ ]

| විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය | නගරය | නගර අංකය |
|---|---|---|
| 1 වැනි කැමැත්ත | | |
| 2 වැනි කැමැත්ත | | |
| විභාග නිවේදනයේ ආරම්භක ඡේදය බලන්න. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | | |

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.
(උදා. : GUNAWARDANA, M. G. B. S. K.)

02. මුල්'කුරුවලින් හැඳින්වෙන නම් :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

03. *ස්ථිර ලිපිනය :*
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

04. *ස්ත්‍රී/පුරුෂ භාවය :*

ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

06. ජන වර්ගය : [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ඉන්දියා ද්‍රවිඩ - 3/මුස්ලිම් - 4/බර්ගර් - 5/ මැලේ - 6

07. පදිංචිය :————.
(i) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————. එහි අංකය : [ ]

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(iii) දිස්ත්‍රික්කය :————.

08. උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

2014.12.26 දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

09. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) අ. පො. ස. (සා. පෙළ.) :

විභාග අංකය:—————. වර්ෂය :—————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* | *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| (i) | | | (v) | | |
| (ii) | | | (vi) | | |
| (iii) | | | (vii) | | |
| (iv) | | | (viii) | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ) :

විභාග අංකය :—————. වර්ෂය:—————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

(ආ) වෘත්තීය සුදුසුකම් :

| *පාඨමාලාව* | *වර්ෂය* |
|---|---|
| | |
| | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :—————.

(අදාළ කොටුව තුළ " x " ලකුණ යොදන්න)

ඔව් [ ] නැත [ ]

11. *අයැදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙලිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවාද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) ………… දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. 600 ක් ගෙවා ලබා ගත් අංක …… දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ එහි දාරයකින් අලවන්න. |
| (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :—————.

12. *අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… මහතා, මම පුද්ගලිකව හඳුනමි. ඔහු ……………… දින ඉහත අත්සන මා ඉදිරිපිටදී තැබූ බව ද සහතික කරමි. තවද විභාගයට නියමිත විභාග ගාස්තු ගෙවා ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

—————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :—————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.

තනතුර :—————.
ලිපිනය :—————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කර ඇති ……………………… මහතා ………………… දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ………… දින සිට ………… දින දක්වා ……………………… වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ එන්ජින් රියදුරු III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.
(අදාල නොවන වචන කපා හරින්න.)

—————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

11-876

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී - බණ්ඩ 1 සේවා ගණයේ තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2014**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී - බණ්ඩ 1 සේවා ගණයේ "ඇගයීම් නිලධාරී" තනතුරෙහි පුරප්පාඩු 21ක් සම්පූර්ණ කිරීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත විභාගයක් පවත්වනු ලබන අතර ලිඛිත විභාගයේ සියළුම විෂයයන් සමත් අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීමට අපේක්‍ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල හා ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණුවල ප්‍රමාණයේ එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාව අනුව අදාල තනතුරේ II ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**ලිඛිත විභාගය :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම | පැය 01 1/2 | 100% | 40% | කාලීන, සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර් ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව, මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| 2. බුද්ධි පරීක්‍ෂණය | පැය 01 | 100% | 40% | පදගත හා සංඛ්‍යාත්මක රූපකාර සන්දර්භයන් තුළ ඉදිරිපත් කරන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්‍ෂා කිරීම තුළින් අවබෝධ කර ගැනීමේ හැකියාව හා බුද්ධිය මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| පළපුරුද්ද | 30 |
| භාෂා ප්‍රවීණතාවය | 20 |
| පරිගණක හැකියාව | 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 |
| එකතුව | 100 |

02. *අධ්‍යාපන සුදුසුකම් :*

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේ දී උපාධියක් ලබා තිබීම.

*සහ*

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා හෝ වාණිජ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

03. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

04. *වැටුප* :-
මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) පරිදි, වැටුප් කේත අංක MN-6-2006(ඒ) රු. 17,680-10x320-11x365-15x450-රු. 31,645 වැටුප් පරිමාණය හිමි වේ.

05. ඉහත තනතුර සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සියලුදෙනා විශිෂ්ඨ චරිතයකින් හා ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :-

(i) මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කරගත් අයදුම්පත් තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කොට "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10" යන ලිපිනයට 2014.12.29 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "ඇගයීම් නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය" යන්න පැහැදිලිව ලියා තිබිය යුතුය.

(ii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

(iii) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

(iv) විභාග ගාස්තුව රු. 400ක් වේ. එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-100-139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ම ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

(v) සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 2,40,360 හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(vi) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

(vii) අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එම තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

(viii) දෙපාර්තමේන්තුවේ කිසිවකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර, එසේ එවන හෝ අතින් ගෙනැවිත් භාරදෙන හෝ අයදුම්පත් කිසිවක් භාරගනු නොලැබේ. යම් අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ වන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

*07. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම* :-
රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතු ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලයක වුවද සේවය කිරීමට හැකි විය යුතු ය.
(iii) තෝරාගනු ලබන අපේක්ෂකයන් ඇගයීම් නිලධාරී තනතුරට අදාළ දැනට අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට ද, ඉදිරියේ දී සිදුවන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මුදල් රෙගුලාසිවලට ද, අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු

කොන්දේසි හා විධිවිධානවලට ද රජය හෝ රේඛීය අමාත්‍යාංශය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

09. *විභාග පරිපාටිය* :

(i) විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් පරීක්ෂණ හා ඇගයීම් අධ්‍යක්ෂ විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(iii) තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය; හෝ

පමණක් පිළිගැනේ.

(iv) විභාගය ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම්කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු අනුව මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන්ට පමණක් ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(vi) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(vii) මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ පමණක් පවත්වනු ලැබේ.

10. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

ජේ. ඒ. රංජිත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2014 නොවැම්බර් මස 28 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

***ආදර්ශ අයදුම්පත්‍රය***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි - බණ්ඩ I සේවා ගණයේ ඇගයීම් නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2014 සඳහා වන අයදුම්පත්‍රය

අයදුම්කරන භාෂා මාධ්‍ය :

1. අයදුම්කරුගේ නම :

(i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————. මයා/මිය/මෙනවිය.

2. ලිපිනය හා දුරකථන අංකය :
   (i) (අ) කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.
   (ආ) කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
   (ඇ) කාර්යාලයීය දුරකථන අංකය :————.

   (ii) (අ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.
   (ආ) පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
   (ඇ) පෞද්ගලික දුරකථන අංකය :————.

3. උපන් දිනය :

   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

   අවුරුදු :————. මාස :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

| උපාධියේ නම හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ නම | වලංගු දිනය | ප්‍රධාන විෂයයන් | සාමාර්ථය | විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

9. වෙනත් අධ්‍යාපන/භාෂා ප්‍රවීණතාවය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් : (තිබේනම්)

| විභාගය/ඩිප්ලෝමාව/පාඨමාලාව | සම්පූර්ණ කළ වර්ෂය | ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|
| | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර : (තිබේනම්)

| සේවය කළ ආයතන | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/ අර්ධ රාජ්‍ය අංශය/ පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

11. (i) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් පෙළපතින්ද/ලියාපදිංචි කිරීමෙන්ද යන්න සඳහන් කරන්න.
   (ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේ ද? :————.

13. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද? :————.

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

15. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.

මුදල් ගෙවූ දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන සේ අමුණා එවිය යුතු ය.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:————.
තනතුර :————.
ලිපිනය :————.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන.......................... මයා/මිය/මෙනවිය දැනට............ තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය/නොහැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)

11-927

### අධ්‍යාපන අමාත්‍යාංශය

### ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2015/2016

01. ගුරු විද්‍යාලයන්හි දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අත්සන් කළ විධිමත් පත්වීම් ලබා ඇති රජයේ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන්,

1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ඇති පෞද්ගලික පාසල් නාම ලේඛනයේ ඇතුළත් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති ගුරුවරුන්,

1.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති පිරිවෙන් ගුරුවරුන්,

1.4 මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දුරස්ථ, ප්‍රින්සෙට් හෝ උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ සති අන්ත ගුරු පුහුණු පාඨමාලාව හදාරා අසාර්ථක වූ බව අදාළ ගුරු පුහුණු බලධාරීන් විසින් සහතික කර ඇති ගුරුවරුන්.

02. විශේෂ උපදෙස් :

2.1 ගුරු විද්‍යාලයන්හි පවතින පුරප්පාඩු මත පාසලේ වැඩ භාරගැනීමේ ජ්‍යෙෂ්ඨතාවය පදනම් කර ගෙන තෝරා ගැනීම් සිදු කෙරේ. ගුරු සේවයේ උසස්වීම්වල දී වෘත්තීය සුදුසුකම් නොමැතිවීම නිසා පාඩු සිදුවනවා පමණක් නොව පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය ඇති කර ගැනීමට ද බාධාවක් වී ඇත. මෙම සියලු කරුණු සලකා සියලුම උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණුව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

2.2 මෙම පාඨමාලාව අවුරුදු දෙකක නේවාසික පුහුණුවක් වන අතර, නේවාසික පහසුකම් නොමැති අවස්ථාවල විදුහල්පතිගේ ලිඛිත අවසරය මත ගුරු විදුහලට ආසන්නයේ නේවාසික වීමට අවසර දෙනු ලැබේ.

2.3 පාඨමාලා පැවැත්වීම සඳහා ඇති පහසුකම් අනුව පාඨමාලාව පැවැත්වෙන ගුරු විද්‍යාලය තීරණය වන බැවින් සැමවිටම ආසන්න ගුරු විද්‍යාලය ලබා දීමට නොහැකි වේ.

2.4 ගුරු විද්‍යාලයෙහි පුහුණු කාලය තුළ වෙනත් පාඨමාලා හැදෑරීම හෝ වෙනත් බාහිර විභාගවලට පෙනී සිටීම හෝ නොකළ යුතු ය. ඒ පිළිබඳ ලැබෙන තොරතුරු හා පාඨමාලා හැරයාම පිළිබඳ ව විධිමත් පරීක්ෂණයකින් පසු විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව පහත දැක්වෙන ගුරුවරුන්ට අදාළ නොවේ.

(අ) කවර හෝ ගුරු විද්‍යාලයක දැනටමත් පුහුණුව ලබන්නා වූ හෝ පුහුණුව ලබා ඇති ගුරුවරුන්,

(ආ) උපාධිධාරී අභ්‍යාසලාභී ගුරු පත්වීම් හෝ උපාධිධාරී කළමනාකරණ සහායක පත්වීම් හෝ ඒ සමාන කවර හෝ උපාධි පත්වීමක් ලබා ඇති ගුරුවරුන්,

(ඇ) මෙහි අංක 07හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති ගුරුවරුන්,

ඉහත විස්තර අනුව සුදුසුකම් සපුරා නොමැති අය පාඨමාලාවට ඇතුළත් වී ඇති බව දැන ගැනීමට ලැබුණු අවස්ථාවක පුහුණුවන කාලය තුළ දී නම් පුහුණුව අවලංගු කරන අතර, පුහුණුවෙන් පසුව නම් ඔහුගේ හෝ ඇයගේ ගුරු පුහුණු සහතිකය අවලංගු කරනු ලැබේ.

2.6 සෑම අයදුම්කරුවෙකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපංදිංචි වීමට කැඳවන දිනයේ දී භාරදිය යුතු ය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත්කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 05 ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත,

2.7 1982 අප්‍රේල් මාසයෙන් පසුව දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරු පත්වීම් ලැබ පුහුණුවට ඇතුළත් වන අය ගුරු පුහුණුවෙන් පසුව ද මුල්පත්වීම ලද එම දිස්ත්‍රික්කවල ම සේවය කිරීමට යටත් වන බව ද සැළකිය යුතු ය,

2.8 ගුරු පුහුණු පාඨමාලාවන් සඳහා ගුරු විද්‍යාලයකට ඇතුළත් වූ පසු කිසිම පුහුණුලාභියෙකුට තම අභිමතය පරිදි පාඨමාලාවෙන් ඉවත්විය නොහැකි ය. එසේ ඉවත් වුවහොත් රජයේ වියදම් තක්සේරු කර අධිභාරය සමග අයකරනු ලැබේ,

2.9 මෙම ගැසට් නිවේදනයේ සඳහන් තොරතුරු මත මතුවන ගැටළු පිළිබඳව අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

03. (i) ගුරු විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට නොපැමිණීම සාමාන්‍ය හැසිරීම ගුරු විද්‍යාලයේ විනය ගරුකත්වයට අනුකූල නොවන බව වැටහේ නම් හා ඉගෙනීම පිළිබඳ උද්‍යෝගීතාව දැක්වීමට අපොහොසත් වන්නේ නම් පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව ලබන ගුරුවරයෙකුගේ පාඨමාලාවට සහභාගී වීම සහ පැමිණීම 80% ට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවක දී විශේෂ කාරණයක් මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

(ii) නිවාඩු :

ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණයෙන් ම යොදා ගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත්වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබා ගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්මවිය යුතු ය.

අධික ලෙස නිවාඩු ගැනීම හේතුවෙන් පාඨමාලාව අධ්‍යයනය කිරීමේ ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියෙකු පිළිබඳ ව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා පාසල්වලට ආපසු යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජය පිළිගත් වෛද්‍යවරයෙකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

04. ගුරු විද්‍යාලය විසින් පවත්වනු ලබන පරීක්ෂණවලින් සහ දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් ද සමත්වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ.

05. වැටුප් පරිමාණය :

ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළව පසුකාලීන සංශෝධනයන්ට යටත්ව පුහුණු ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පසු අදාළ වන වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

06. (i) සෑම අයදුම්කරුවෙකු ම තමා පත්වීම් ලද විෂයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. එහෙත් විශේෂ අධ්‍යාපන පාඨමාලාවට පමණක් වෙනත් විෂයයන්ගෙන් පත්වීම් ලද ගුරුවරුන්ට ද ඉල්ලුම් කළ හැකි ය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවල දී තමා අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත්වූ විෂයයන්ගෙන් ගුරු පුහුණුව ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයයන් උගන්වන බවට අනුමත කාලසටහනෙහි පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවල දී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාලසටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) යම් පාඨමාලාවක් සඳහා අයදුම්කරුවන් ප්‍රමාණවත් පිරිසක් ඉල්ලුම් නොකළහොත් එම පාඨමාලාව පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ ව අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

| | *පාඨමාලාවේ අංකය* | *පාඨමාලාවේ නම* |
|---|---|---|
| i. | 01 | සිංහල |
| ii. | 02 | ප්‍රාථමික අධ්‍යාපනය |
| iii. | 03 | සමාජ විද්‍යාව |
| iv. | 04 | විද්‍යාව |
| v. | 05 | ගණිතය |
| vi. | 06 | කෘෂි විද්‍යාව |
| vii. | 07 | ගෘහ විද්‍යාව |
| viii. | 08 | ඉංග්‍රීසි |
| ix. | 09 | බුද්ධ ධර්මය |
| x. | 10 | ක්‍රිස්තියානි/රෝමානු කතෝලික ධර්මය |
| xi. | 11 | හින්දු ධර්මය |
| xii. | 12 | ඉස්ලාම් ධර්මය |
| xiii. | 13 | චිත්‍ර කර්මය |
| xiv. | 14 | සංගීතය |
| xv. | 15 | නැටුම් |
| xvi. | 16 | අරාබි |
| xvii. | 17 | විශේෂ අධ්‍යාපනය |
| xviii. | 18 | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| xix. | 19 | වාණිජ |
| xx. | 20 | දෙමළ |
| xxi. | 21 | ශාරීරික අධ්‍යාපනය |
| xxii. | 22 | දෙවන බස (සිංහල/දෙමළ) |

07. (i) සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

I යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

II ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

III දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හා මව්බස ඇතුළුව විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) හෝ ජා.පො.අ.ස. විභාගය සමත් වී සිටිය යුතු ය.

IV රජයේ පාසල්වල සේවයේ නියුක්ත ගුරුවරුන් 2014.11.28 වැනි දින වන විට ගුරුවරයකු ලෙස අවම වශයෙන් මාස තුනක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

V සෑම අයදුම්කරුවකු ම තම පත්වීමේ ස්වභාවය මුල් පත්වීම් ලිපිය ඇසුරෙන් සනාථ කළ යුතු ය.

(ii) පහත සඳහන් පාඨමාලා තෝරා ගන්නා අයට ඉහත කී සුදුසුකම්වලට අමතර ව මතු දැක්වෙන සුදුසුකම් ද තිබිය යුතු ය.

(අ) සිංහල පාඨමාලාව-
අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ආ) විද්‍යා පාඨමාලාව-

I අ.පො.ස. (සා/පෙළ) පැරණි නිර්දේශයේ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය යන විෂයයන්ගෙන් දෙකකටවත් සම්මාන සාමාර්ථය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. (උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව හෝ සමග ජීව විද්‍යාව ගණන් නොගැනේ.); *හෝ*

II නව නිර්දේශයේ විද්‍යාව, ගණිතය විෂයයන් සමත්වීම හා විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

III ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත් වීම.

(ඇ) ගණිතය පාඨමාලාව :

I අ.පො.ස. (සා/පෙළ) පැරණි නිර්දේශයේ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය, මූලික ගණිතය, ශුද්ධ ගණිතය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් දෙකකටවත් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

II අ.පො.ස. (සා/පෙළ) නව නිර්දේශයේ ගණිතය හා විද්‍යාව සමත්වීම හා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

III ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත්වීම.

(ඇ) කෘෂි විද්‍යා පාඨමාලාව :

I පැරණි නිර්දේශයේ අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

II අ.පො.ස. (සා/පෙළ) නව නිර්දේශයේ විද්‍යාව හා කෘෂි විද්‍යාව සමත්වීම හා කෘෂි විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

III අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සමත් වී තිබීම;

*හෝ*

IV ජා.පො. අ. ස. විභාගයේ දී නම් ඉහත සඳහන් විෂයයකට ඒ හෝ බී සාමාර්ථයක් ලබා සිටීම. (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි);

*හෝ*

V කෘෂිකර්මය සම්බන්ධයෙන් රජයේ ගොවිපලක මාස 06 කට නොඅඩු කාලයක පුහුණුවක් ලබා තිබීම.

(ඉ) ගෘහ විද්‍යා පාඨමාලාව :

I අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ගෘහ විද්‍යාව, මැහුම් වැඩ යන විෂයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

II අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ගෘහ විද්‍යාව විෂයය සමත්ව තිබීම; *හෝ*

III ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත කී විෂයයන්ට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි);

*හෝ*

IV රජයේ කාර්මික විදුහලක වසරකට නොඅඩු කාලයක් ගෘහ විද්‍යාව හාදාරා ලබා ගත් සහතිකයක් තිබීම.

(ඊ) ඉංග්‍රීසි පාඨමාලාව :

I දැනට ඉංග්‍රීසි ගුරු පත්වීමක් ලබා තිබීම;

*හෝ*

II ඉංග්‍රීසි i, ii හෝ iii පෙළ ගුරු සහතික පත්‍රය ලබා දැනට සේවයේ යෙදී සිටීම;

*සහ*

III අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

IV ඊට උසස් විභාගයකින් ඉංග්‍රීසි විෂයය සමත්ව තිබීම.

(උ) ආගම පාඨමාලාව :

I බුද්ධ ධර්මය, රෝමානු කතෝලික ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යන පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අය තමා හැදෑරීමට බලාපොරොත්තු වන ආගම විෂයයට අ.පො.ස (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

II ජා.පො.අ.ස. විභාගයේ දී ආගම විෂයයට ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

III ඉහත I හි සඳහන් විෂයයකින් හෝ ඊට අදාළ විෂයයකින් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම.

(ඌ) චිත්‍ර කර්ම පාඨමාලාව :

I රජයේ ලලිත කලායතනයේ සහතික පත්‍රය (චිත්‍ර කර්මය පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාව);

හෝ

II චිත්‍ර කර්ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ගුරු සහතික පත්‍රය;

*හෝ*

III අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සම්මාන සාමාර්ථය;

*හෝ*

IV ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත චිත්‍ර කර්මය විෂයයට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (සෞන්දර්යය විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි);

*හෝ*

V අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

(එ) සංගීත පාඨමාලාව :

I ලංකා ගාන්ධර්ව සභාවේ සංගීතය පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග සංගීත විභාගයේ හෝ ජාතික සංගීත විභාගයේ ප්‍රථම විභාගය;

*හෝ*

II රජයේ සංගීත විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

*හෝ,*

III උත්තර ලංකා පෙරදිග සංගීත ගුරුවරුන්ගේ සංගමයේ සංගීතය පිළිබඳ සහතික පත්‍රය (5 වැනි ශ්‍රේණිය);

*හෝ,*

IV පිළිගත් ඉන්දීය සංගීත ආයතනයක සංගීතය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

*හෝ,*

V අ.පො.ස (සා/පෙළ) හෝ ජ්‍යෝෂ්ඨ සහතික පත්‍ර විභාගයේ දී සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක්;

හෝ

VI අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සංගීත විෂයයට සාමාර්ථයක්;

හෝ

VII ජා.පො.අ.ස. විභාගයේ දී සංගීත විෂයයට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (සෞන්දර්යය විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි).

(ඒ) නැටුම් පාඨමාලාව :

I ලංකා ගාන්ධර්ව සභාවේ නැටුම් පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග නැටුම් විභාගයේ හෝ ජාතික නැටුම් විභාගයේ ප්‍රථම විභාගය;

හෝ,

II රජයේ නැටුම් විද්‍යාලයේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; හෝ

III පිළිගත් ඉන්දීය නැටුම් ආයතනයක අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

හෝ

IV අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී නැටුම් විෂයය සඳහා සම්මාන සාමාර්ථය;

හෝ

V අ.පො.ස. (උ/පෙළ.) විභාගයේ දී නැටුම් විෂයය සඳහා සාමාර්ථයක්;

හෝ

VI ජා. පො. අ. ස. විභාගයේ දී නැටුම් විෂයය සඳහා ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම (සෞන්දර්ය විෂයය කුමක් දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි).

(ඔ) අරාබි පාඨමාලාව :

I විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල් ආලිම් ප්‍රාරම්භක පරීක්ෂණයේ I වැනි හා II වැනි පරීක්ෂණය සමත්වීම හෝ අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී අරාබි විෂයයට සාමාර්ථයක් ලබා තිබීම; හෝ

II පිළිගත් මද්රසා ආයතනයක අවසාන පරීක්ෂණයෙන් සමත්වීම.

මේ සඳහා මද්රසා ආයතන පහත සඳහන් වේ.

1. බහිජතුල් ඊබ්‍රාහිමියා අරාබි විදුහල, කොටුව, ගාල්ල
2. ගෆූරියා අරාබි විදුහල, මහරගම
3. මද්රසතුල් බාරි අරාබි විදුහල, වැලිගම
4. කාසිමියා අරාබි විදුහල, පුත්තලම
5. නද්වතුල් උලමා අරාබි විදුහල, මුත්තූර්
6. නැගෙනහිර ලංකා අරාබි විදුහල, ආඩ්ඩාලච්චේන
7. මදාසතුල්පුලා අරාබි විදුහල, කාත්තන්කුඩි
8. මුස්ලිම් කාන්තා අරාබි විදුහල, කල්එළිය
9. මද්රසතුල් ජාෆ්රියා අරාබි විදුහල, ගාල්ල
10. හිදාදියා අරාබි විදුහල, මාදම්පේ
11. නද්වතුල් බුහාරි අරාබි විදුහල, කින්නියා
12. මද්රසතුල් නූර්නියා අරාබි විදුහල, කොටුවේගොඩ, මාතර
13. මක්කියා අරාබි විදුහල, ගාල්ල

හෝ

වෙනත් පිළිගත් ආයතනයක් (සම්මුඛ පරීක්ෂණයේ දී පිළිගත් ආයතනයක් බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.)

III ඉහත දැක්වෙන I හෝ II හි සඳහන් සුදුසුකම් සහිතව වෙනත් ගුරු පත්වීම් ලබා සිටින ගුරුවරුනට ද මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ඕ) විශේෂ අධ්‍යාපන පාඨමාලාව :

මෙම පාඨමාලාවේ අංශ තුනකි.

1. දෘශ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීම
2. ශ්‍රව්‍යාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීම
3. මන්ද මානසික (මන්ද බුද්ධික) ළමයින්ට ඉගැන්වීම

තමන් කැමති අංශය අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. තෝරා ගැනීමේ දී ඉංග්‍රීසි දැනුම තිබෙන අය පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ක) හස්ත කර්මාන්ත හා තාක්ෂණ කුසලතා පාඨමාලාව :

I අ. පො. ස. (සා/පෙළ) හෝ ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී,

ලී වැඩ
ලෝහ වැඩ
විවීම
මැටි ශිල්පය
මෝටර් කාර්මික ශිල්පය
ගුවන් විදුලි කාර්මික ශිල්පය
පෙදරේරු ශිල්පය යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

II ජා. පො. අ. ස. විභාගයේ දී නම් අදාළ විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයය කුමක් දැයි විදුහල්පතිගේ සහතිකයක් අවශ්‍යයි);

හෝ

III රජයේ කාර්මික විද්‍යාලයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ පවත්වන අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් පුහුණු සහතිකයක් තිබීම.

(ග) වාණිජ පාඨමාලාව :

I අ. පො. ස. (සා/පෙළ) හෝ ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණකාධිකරණය, යතුරු ලියනය, ලඝු ලේඛනය, වාණිජ්‍යය හා මූල්‍ය යන විෂයයන්ගෙන් දෙකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

II අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ඉහත සඳහන් විෂයයන් දෙකක් සමත්ව තිබීම; හෝ

III රජයේ කාර්මික විද්‍යාලයක එක් අවුරුදු වාණිජ පාඨමාලා සහතිකය ලබා තිබීම.

(ජ) දෙමළ පාඨමාලාව :

I අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ට) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව :

I දැනට ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරු පත්වීමක් ලබා තිබීම.

(ඪ) සමාජ විද්‍යාව පාඨමාලාව :

I අ. පො. ස. (සා/පෙළ) විභාගයේදී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී සමාජ අධ්‍යයනය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

II ජා. පො. අ. ස. විභාගයේ දී සමාජ අධ්‍යයනය විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

III භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහා අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(න) දෙවන බස (සිංහල/දෙමළ) පාඨමාලාව :

ඉහත 7 (1) හි සඳහන් සුදුසුකම් ඇති දෙවන බස (සිංහල/දෙමළ) විෂයය සඳහා පත්වීම් ලද ගුරුවරුන්ට මේ පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

08. රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයක සේවයේ නියුක්ත සාමාන්‍ය පන්තිවල සතියකට පැය 20ක් ඉගැන්වීම් කරන ගුරු භවතුන් අතුරෙන් සීමිත සංඛ්‍යාවක් පුහුණුව සඳහා තෝරාගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පාසල් පෞද්ගලික පාසල් වශයෙන් සලකනු ලැබේ.

I 1951 වර්ෂයේ දී ගාස්තු අය කිරීමේ පාසල් බවට පත් වූ උපකෘත පාසල්,
II 1960.12.01 වැනි දිනට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත් වූ පාසල්,
III අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (ප්‍රාදේශීය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවේ.) අනුමත කර ඇති පෞද්ගලික පාසල් හා පිරිවෙන්.

සියලු ම පෞද්ගලික පාසල්වල සේවය කරන අයදුම්කරුවන්ට 2014.11.28 වැනි දිනට අවම වශයෙන් අවුරුද්දක අඛණ්ඩ සේවයක් තිබිය යුතු අතර, ඔවුන්ගේ පළමු පත්වීමේ ලිපිය හා අදාළ ගුරුභවතා අනුමත ගුරු මණ්ඩලයට අයත් බවට සහතික කරන ලද ලිපියක් අදාළ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගෙන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට 2014.11.28 වැනි දිනට අවම වශයෙන් අවුරුදු දෙකක (02) සේවා කාලයක් තිබිය යුතු ය. 1959 පිරිවෙන් පනත හෝ 1979 අංක 64 දරන පනත යටතේ අනුමත සේවය මේ සඳහා ගණන් ගනු ලැබේ.

දැනට පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට ඉල්ලුම් කළ හැක්කේ සිංහල, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා බුද්ධ ධර්මය යන පාඨමාලාවන්ට පමණි. (පත්වීම් ලද විෂයයෙන්ම ගුරු පුහුණුව ලැබිය යුතු ය.) විද්‍යායතන පිරිවෙන්වල උගන්වන අනුමත ගුරුවරුන්ට පමණක් මීට අමතරව සංගීතය, චිත්‍ර, නැටුම්, වාණිජ, ශාරීරික අධ්‍යාපනය සහ කෘෂි විද්‍යාව යන පාඨමාලා සඳහා ද ඉල්ලුම් කළ හැකි ය.

සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල් ගුරුවරුන් පාලක මණ්ඩලයේ කළමනාකරුගෙන් ද, පිරිවෙන් ගුරුවරුන් කෘත්‍යාධිකාරීගෙන් ද, පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

I පුහුණුවන කාලයේ දී ගුරු භවතා සේවයෙන් නිදහස් කළ හැකි බවට,

II පුහුණුවන කාලය තුළ ගුරු භවතාට වැටුප් ගෙවන බවට,

III පුහුණුව අවසානයේ දී පාලක මණ්ඩලය විසින් අදාළ ගුරු භවතා නැවත සේවයේ යොදවා ගන්නා බවට,
IV පුහුණුව සඳහා තෝරා ගන්නා පිරිවෙන් ගුරු භවතුන් වෙනුවට වෙනත් ගුරු භවතුන් නොඉල්ලන බවට හා ඔහුගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවට,

රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වලින් තෝරා ගන්නා ගුරුවරුන් පුහුණුව සඳහා ලියාපදිංචි වීමට පෙර "පුහුණුවෙන් පසු රජයේ පාසල්වල රැකියා නොඉල්ලන බවට" පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතු ය.

රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් ඉදිරිපත් වන ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කළ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතු ය. වයස අවු. 18ට පෙර පත්වීම් ලබා සිටින ගුරුවරුන්ගේ පත්වීම් දිනය ගණන් ගැනෙනුයේ අවුරුදු 18 සම්පූර්ණ වූ දින සිට ය. වෙනත් නිලධාරියෙකු මෙම පත්වීම් ලිපිය අත්සන් කර ඇත්නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සත්‍ය බවට සහතික කර තිබිය යුතු ය.

09. *තෝරා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම.—*

I. මෙම *ගැසට් නිවේදනයේ* දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතු ය.

(අ) ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ආකෘති පත්‍රය 8" x 12" (A4) කඩදාසියක දෙපැත්තේ පිළියෙල කළ යුතු ය.

(ඇ) කිසිම කොටුවක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර එකිනෙකට ගොඩ ගැසෙන සේ පිළියෙල නොකළ යුතු ය.

II. අයදුම්කරු විසින් අයදුම්පත්‍රය නොඅඩුව හා නිවැරදි ව පිරවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) සෑම අයදුම්කරුවකු ම තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදි ම සඳහන් කළ යුතු ය.

(ආ) තම පාසලේ විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ප්‍රධානියා ඉල්ලුම් කරන්නේ නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) දක්වා ඇති උපදෙස් පරිදි පිළියෙල කරන ලද සියලු ම අයදුම්පත්‍ර පහත දක්වා ඇති ආකෘතියේ පරිදි සකස් කරන ලද ලිපි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "**ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2015/2016**" ලෙස ද පාඨමාලාව, මාධ්‍යය සහ කලාපය ද සඳහන් කර 2014.12.28 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "**අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන**

පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

| ලියාපදිංචි තැපැල |
|---|
| "ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2015/2016" |
| පාඨමාලාව :————. |
| මාධ්‍යය :————. |
| කලාපය :————. |
| අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. |

(ඊ) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර,

(i.) අයදුම්පත්‍රය ලැබුණු බවට දන්වනු නොලැබේ.
(ii.) අයදුම්පත්‍රයට සෙසු ලියවිලි අමුණා නොඑවිය යුතු ය.
(iii.) සුදුසුකම් පරීක්‍ෂා කිරීමට පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයේදී සියලු ම සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

III. "ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2015/2016" පාඨමාලා සඳහා සතිඅන්ත හෝ දුරස්ථ පාඨමාලා නොපැවැත්වේ.

10. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 28 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

***ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2015/2016***

1. මාධ්‍යය : [ ]

2. මුල් පත්වීමේ ලිපිය අනුව පාසලේ වැඩ භාරගත් දිනය : [ ]

3. පාඨමාලාව : [ ]

4. මුල් පත්වීමේ ස්වභාවය, විෂය සහ ඔබ අයත් වන සේවය/ශ්‍රේණිය :

(*a*) මුල් පත්වීමේ ස්වභාවය : [ ]

(*b*) විෂය : [ ]

(*c*) අයත් වන සේවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)
ශ්‍රී ලංකා ගුරු සේවය - 01
ගුරු සහායක - 02
වෙනත් (සඳහන් කරන්න) - 03 [ ] [ ]

(*d*) ශ්‍රේණිය : [ ]

5. ඔබ දුරස්ථ හෝ සතිඅන්ත ගුරු පුහුණුව ලබා සම්පූර්ණ කර නැත්නම් පමණක් පහත විස්තර සපයන්න :

(*a*) පාඨමාලාව :————.
(*b*) වර්ෂය :————.
(*c*) අවසාන විභාග ප්‍රතිඵලය :————.

6. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු දෙවනුව ලියන්න. උදා : PERERA, A. B.) :
Rev./Mr./Mrs./Ms. :————.

7. මුලකුරු වලින් දැක්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.) :————.

8. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)

පුරුෂ - 1 ස්ත්‍රී - 2 [ ]

9. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

10. (අ) උපන් දිනය :————.
(ආ) 2014.11.28 වැනි දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

11. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

12. ඊ-මේල් ලිපිනය (ඇත්නම් ) :————.

13. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :——.

14. වර්තමාන සේවා ස්ථානය, ලිපිනය, දිස්ත්‍රික්කය සහ කලාපය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :

(i.) සේවා ස්ථානය :————.
(ii.) ලිපිනය :————.
(iii.) දිස්ත්‍රික්කය :————.
(iv.) කලාපය :————.
(v.) සේවා ස්ථානයේ ස්වභාවය : (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)

(*a*) රජයේ පාසලකි - 01
(*b*) වතු පාසල් - 02
(*c*) රජයේ අනුමත පිරිවෙනකි - 03
(*d*) රජයේ අනුමත පෞද්ගලික පාසලකි - 04
(*e*) වෙනත් - 05

15. අධ්‍යාපන සුදුසුකම් :

(i.) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල :

| | | පළමුවර | | දෙවනවර |
|---|---|---|---|---|
| | වර්ෂය : | | | |
| | විභාග අංකය : | | | |
| අනු. අංකය | විෂයය | ලබාගත් ශ්‍රේණිය | | |
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |
| 6. | | | | |
| 7. | | | | |
| 8. | | | | |
| 9. | | | | |
| 10. | | | | |

(ii.) අ. පො. ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල :

| | | පළමුවර | දෙවනවර |
|---|---|---|---|
| | වර්ෂය : | | |
| | විභාග අංකය : | | |
| අනු. අංකය | විෂයය | ලබාගත් ශ්‍රේණිය | |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

16. සේවා විස්තරය :

| අනු. අංකය | සේවය කළ පාසල | සේවා කාලය | දුෂ්කර ද නැද්ද යන බව |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

(i.) ඉහත දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත් පාඨමාලාවට තෝරා නොගන්නා බවත්, පාඨමාලාවට තෝරා ගැනීමෙන් පසු යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කිරීමට යටත් වන බවත් මෙයින් පිළිගනිමි.

(ii.) දැනට වෙනත් කිසිම ආයතනික ගුරු පුහුණුවකට සහභාගි නොවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. විදුහල්පතිවරයාගේ නිර්දේශය :

(i.) දැනට ගුරු මණ්ඩලයේ සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව :————

(ii.) ශිෂ්‍ය සංඛ්‍යාව :————.

(iii.) අයදුම්කරු ගුරු පුහුණුව සඳහා නිදහස් කළහොත් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසලේ සිටින ගුරු හවතුන් සංඛ්‍යාව ප්‍රමාණවත් ද? :———

ඉහත අයදුම්කරු මාගේ පාසලේ ......... දින සිට ගුරු සේවයේ/ ගුරු සහායක ලෙස සේවය කරන බවත්, අයදුම්කරු ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා......... හිමි/මයා/මිය/මෙනවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

————,
විදුහල්පතිගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

දිනය :————.

19. ................................... හිමි/මයා/මිය/මෙනවිය ......... කලාපයේ ................. විද්‍යාලයේ ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවයේ නියුතු බවත්, ඔහු/ඇය ................. දිනැති මුල් පත්වීම අනුව ......... දින වැඩ භාරගෙන ඇති බවත්, ......... දින සිට මේ දක්වා මෙම පාසලේ සේවය කරන බවත්, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර මවිසින් පරීක්‍ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා .......................... හිමි/ මයා/ මිය/මෙනවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.

20. ................................... හිමි/මයා/මිය/මෙනවිය ......... කලාපයේ ................. විද්‍යාලයේ ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවය කරන බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර මවිසින් පරීක්‍ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා ................. හිමි/මයා/මිය/මෙනවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

_________,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

දිනය :————.

11-914

---

## රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

### වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් (වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින්) අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| බඳවා ගනු ලබන තනතුරු සංඛ්‍යාව | - 05යි |
| කාර්මික සහකාර (සිවිල්) | - 04 |
| කාර්මික සහකාර (යාන්ත්‍රික) | - 01 |

01. සේවා කොන්දේසි :-

රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ කාර්මික සහකාර තනතුරට බඳවා ගනු ලැබේ.

1.1 තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

1.2 පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ.

1.3 පත්වීම ස්ථිර කිරීම සඳහා පත්වීම් දින සිට තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1.4 තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර 5 ක් ඇතුළත 2007.05.28 දිනැති රා. පරි. 07/2007 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

1.5 පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

02. *වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව - වැටුප් ක්‍රමය MN-3-2006A

රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 ක් වන මාසික වැටුපක් ලැබේ.

03. *වයස් සීමාව* :-

3.1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

3.2 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.3 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

04. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගණිතය/විද්‍යාව/තාක්ෂණ වේදය යන විෂය ධාරා යටතේ සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එකවර සමත් ව තිබීම ප්‍රමාණවත් වේ.)

(ඇ) රාජකාරි විෂය ක්ෂේත්‍රයට ආදළ වන පරිදි පැතුරුම්පත් (Excel) හා (Auto CAD) භාවිතය පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

05. වෘත්තීය සුදුසුකම් :-

* කාර්මික සහකාර (සිවිල් හා යාන්ත්‍රික)

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු ජාතික ඩිප්ලෝමාව

හෝ

(iii) අධ්‍යාපන හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(vi) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

(vii) ඉහත තාක්ෂණික සුදුසුකම් වලට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ඉහත සුදුසුකම් තනතුරට අදාළ ක්ෂේත්‍රයන් විය යුතු ය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතු ය.

පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත යුතු අතර, ලකුණු ලබාගත් සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

07. පොදු තරග විභාගය

7.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

7.2 අපේක්ෂකයන්ට කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.3 විභාග ගාස්තුව රු. 1000 කි.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද මාලිගාවත්ත, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුමපත්‍රයේ අමුණා එවිය යුතු ය. (*එය නොඇලවිය යුතු ය.*)

7.4 විභාග විෂයන් : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි
2. පොදු පරීක්ෂණය : කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි

7.5 2015 පෙබරවාරි මස තුළ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් දෙපාර්තමේන්තුවේ දී මෙම විභාගය පවත්වනු ලැබේ.

7.6 විෂය නිර්දේශය

01. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි

* පදගත, සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්භනයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ, විශ්ලේෂණය කිරීමේ හා තීරණය කිරීමේ ශක්තිය මැනීම.

02. *පොදු පරීක්ෂණය* : කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි
* *කාර්මික සහකාර (සිවිල්)*

(i) වෙරළ කලාපය කළමනාකරණය කිරීම
* වෙරළ කලාපය කළමනාකරණය කිරීම යනු කුමක් ද ?
* එය කෙසේ කළමනාකරණය කරන්නේද ?

(ii) වෙරළ ඛාදනය හා ඊට හේතු/ස්වාභාවික හේතු/මිනිස් ක්‍රියාකාරකම් වෙරළබඩ පරිසරයට උචිත ශාඛ වර්ග.

(iii) වෙරළ ඛාදනයට ලක්වන ප්‍රදේශ, වාර්ෂික වෙරළ ඛාදන තීව්‍රතාවය, හදිසි වෙරළ ඛාදන තත්වයන් මැඩ පැවැත්වීමේ ක්‍රම

* *කාර්මික සහකාර (යාන්ත්‍රික)*

(i) ඇඳීමේ මූලධර්ම පාවිච්චි කරගෙන දෙන ලද රූපසටහනක් අනුව යන්ත්‍රයක හෝ කොටසක හරස්කඩක් හෝ පෙර හෝ පසු පෙනීමක් ඇඳීම සහ භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව හා ව්‍යවහාරික ගණිතය යන විෂයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ගැනීම සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලැබේ.

08. අයදුම්පත් එවිය යුතු ආකාරය :

8.1 මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම යොදාගෙන, පළමු පිටුවෙහි අංක 01 සිට 05 දක්වාත්, ඉතිරි කොටස අනික් පිටුවලටත් ලෙස සකස් කරන ලද ඉල්ලුම් පත්‍රය 2014 දෙසැම්බර් මස 28 වැනි දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය.

සටහන : රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

8.2 නියම ආකාරයකින් ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

8.3 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. පුවත්පත් දැන්වීමක් මගින් අදාළ විභාගය පැවැත්වෙන දිනය ප්‍රකාශයට පත් කරන අතර, අයදුම්කරුවන්ට අදාළ විභාගය පැවැත්වෙන දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් පහත සඳහන් විස්තර සහිතව වහාම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් ට දැන්විය යුතු ය.

(i) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :
(ii) ලිපිනය :
(iii) අයදුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :

09. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.
(i) *උප්පැන්න සහතිකය;*
(ii) *අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික;*
(iii) *වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.*

10. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණය ගැනීමේ බලය වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

ඉංජි. අයි. එම්. වික්‍රමනායක,
*වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්,*
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

2014 නොවැම්බර් මස 14 වැනි දින,
මාලිගාවත්ත,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දී ය.

## රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :
 1.1 මුල් අකුරු අගට යොදා මුල් අකුරු සමග නම :—————.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, උදා :SILVA A. B.)

 1.2 මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :—————.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

 1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :—————.

02. ලිපිනය
 2.1 පෞද්ගලික :—————.
 2.2 කාර්යාලීය :—————.
 2.3 දුරකථන අංකය : රාජකාරි :—————. පුද්ගලික :—————.

03. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :—————.

04. 4.1 උපන් දිනය :

 වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

 4.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐
 පුරුෂ ☐

 5.2 විවාහක/අවිවාහක/වැන්දඹු ද : විවාහක ☐
 අවිවාහක ☐
 වැන්දඹු ☐

06. අධ්‍යාපන සුදුසුකම් :

 අ. පො. ස. (සා/පෙළ) :

 වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයයන්* | *සාමාර්ථ්‍ය* | *විෂයයන්* | *සාමාර්ථ්‍ය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො. ස. (උ/පෙළ) :

වර්ෂය :—————. විභාග අංකය :—————.

| විෂයයන් | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

07. තාක්‍ෂණ සුදුසුකම් :

| පාඨමාලාවේ නම | පාඨමාලාව හදාරන ලද ආයතනය | පාඨමාලාවේ කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

08. පළපුරුද්ද :

| වෘත්තීය පළපුරුද්ද | ආයතනය | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

09. භාෂා කුසලතාවය පිළිබඳ විස්තර :

| භාෂාව | කියවීම | ලිවීම | කථාකිරීම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. පරිගණක හැකියාව පිළිබඳ විස්තර

| පාඨමාලාවේ නම | පාඨමාලාව හදාරන ලද ආයතනය | පාඨමාලාවේ කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

11. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :—————.

මුදල් ඇණවුම් අංකය :—————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 1,000 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්‍ෂ ජනරාල් නමට, ගෙවන කාර්යාලය මාලිගාවත්ත, කුවිතාන්සියෙහි මුල් පිටපත මේ සමග අමුණා එවන්න.
*(කුවිතාන්සිය නොඇලවිය යුතුයි.)*

12. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියළුම තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරා ගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත්, මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත්, කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

*දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය*

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, නිලධාරියා ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතු ය.)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-917

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.